1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීතාවක ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට සීතාවක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ව්ධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියෙහි 3 වන පරිච්ඡේදයේ 3.26 ඡේදයට පටහැනිව මාස 06 හා ඊට වැඩි රු. 88,687,301 ක් වූ ස්ථාවර තැන්පතු, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වර්ෂය ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ වල ඇතුළත්වීම හේතුවෙන් ඊට සමාන වටිනාකමකින් වර්ෂය ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ වැඩියෙන් දක්වා තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ)	ප්‍රමිතියෙහි 3 වන පරිච්ඡේදයේ 3. 29 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද රු. 10,226,982 ක් හා නාගරික සංවර්ධන අධිකාරි තැන්පතු ගිණුමේ ආයෝජනය කරන ලද රු. 18,512,095 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස ඇතුළත් නොකිරීම හේතුවෙන්, ආයෝජන ක්‍රියාකාරම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 28,739,077 කින් වැඩියෙන් දක්වා තිබුණි.	එම	එම
(ඇ)	ප්‍රමිතියෙහි 3 වන පරිච්ඡේදයේ 3.31 ඡේදයට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම්	පිළිතුරු ලබා දී නොමැත.	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට

	තුළ අන්තර්ගත කාරක ප්‍රාග්ධනය වෙනස්වීම යටතේ අයිතම 03 ක එකතුව රු. 99,602,282 ක් ගලපනු වෙනුවට රු. 5,035,107 ක් ගලපා තිබුණු හෙයින් රු. 104,637,389 ක වටිනාකමකින් මෙහෙයුම් ක්‍රියාකරකම්වලින් ජනනය වු ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි.		අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදයේ 6.13 ඡේදයට පටහැනිව සභාවේ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් යටතේ 3.5 ඡේදයට අනුව මිලදී ගන්නා වත්කම් මිලදී ගත් දිනය නොසලකා එම වර්ෂය තුළදී ක්ෂය කිරීම සිදු නොකරන අතර, ඉවත් කිරීම සිදු කරන වර්ෂයේ සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඉ)	ප්‍රමිතියේ 9 වන පරිච්ඡේදයේ 9.9 ඡේදය අනුව ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් කරන පැවරුම්, අතිරික්තයේ/ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත යුතු අතර එලෙස වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත යුතුව තිබුණු රු. 7,054,214 ක්, රු. 70,542,145 ක් ලෙස දක්වා තිබුණි.	එම	එම
(ඊ)	2024 වර්ෂය සඳහා දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් වර්ෂය ආරම්භයේදී පැවැත්විය යුතු වුවද සභාව විසින් එසේ සිදු කර නොතිබුණු හෙයින් ප්‍රමිතියේ 10 වන පරිච්ඡේදයේ 10(2) හා 10(3) ඡේද අනුව සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු දැන්වීම් පුවරු ආදායම්වල ගලා ඒම් ගණනය කළ නොහැකි වී තිබුණි.	2025 වර්ෂය සඳහා දැන්වීම් පුවරු සමීක්ෂණය මේ වනවිට සිදුකර අවසන් බව.	සෑම වර්ෂයක් ආරම්භයේදීම දැන්වීම් පුවරු සමීක්ෂණයක් පවත්වා දැන්වීම් පුවරු ආදායම හඳුනාගත යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයිතම 14 කට අදාළ දේපළ පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම රු. 873,289,378 ක් විය යුතු වුවද මූල්‍ය ප්‍රකාශන තුළ ඉකුත් වර්ෂයේ අවසාන දිනට දේපළ පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම වූ රු. 735,694,922 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වූ වටිනාකම ලෙස ද දැක්වීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණ රු. 137,594,456 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ගිණුම්ගත කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ණයගැති කපා හැරීම රු. 2,252,792 ක් වර්ෂයේ වියදමක් ලෙස හඳුනා නොගෙන සමුච්චිත අරමුදලට හර කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව හෙළිදරව් කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු. 2,503,684 ක කාර්යාල උපකරණ, පරිගණක ගිණුමට ඇතුළත් කිරීම හේතුවෙන් කාර්යාල උපකරණ එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද පරිගණක එම වටිනාකමෙන් වැඩියෙන් ද දක්වා තිබුණි.	රු. 2,503,684 ක කාර්යාල උපකරණ පරිගණක ගිණුමේ ගිණුම්ගත වීම නිවැරදි කරන බව.	වත්කම් නිවැරදි වර්ගීකරණයන් යටතේ හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ මිලට ගන්නා ලද රු. 419,286 ක් වූ කාර්යාල උපකරණ, බඳුන් හා උපකරණ ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් කාර්යාල උපකරණ උක්ත වටිනාකමෙන් අඩුවෙන්ද බඳුන් හා උපකරණ වටිනාකම වැඩියෙන්ද දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව ගිණුම්ගත කරන බව.	වත්කම් නිවැරදි වර්ගීකරණයන් යටතේ හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ ක්ෂය රු. 33,308,215	2025 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව ගිණුම්ගත කරන	දේපළ පිරියත හා උපකරණ ක්ෂය

	ක් වුවද, මූල්‍ය ප්‍රකාශනයේ රු. 28,573,857 ක් ලෙස දක්වා තිබුණු හෙයින් අතිරික්තය රු. 4,734,358 කින් වැඩියෙන් දක්වා තිබුණි.	බව.	නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ ආදායම් අයිතම 07 කට අදාළ වාර්ෂික බිල්කිරීම් එකතුව රු. 49,823,817 ක් ගිණුම්ගත කළ යුතු වුවද, මුදලින් ලැබී තිබුණු එකතුව රු. 47,290,253 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්කය රු. 2,533,564 කින් අඩුවෙන් දක්වා තිබුණි.	එම	ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(උ)	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයේ 9.9 ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් කරන පැවරුම් මූලිකව වෙනත් විස්තීර්ණ ආදායමේ රු. 121,500,918 ක් ලෙස හඳුනාගත යුතු වුවද, සභාව විසින් වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු. 70,542,145 ක් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගැනීම හේතුවෙන් රු. 50,958,773 කින් වෙනත් විස්තීර්ණ ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.	එම	ප්‍රමිතිය ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය.
(ඌ)	විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් ලෙස රු. 12,722,381 ක් වෙනුවට වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු. 70,542,145 ක් දක්වා තිබීම හේතුවෙන් රු. 57,819,764 කින් අයභාරය වැඩියෙන් දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී නිවැරදිව ගිණුම්ගත කරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය.
(එ)	වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනා ගන්නා ලද වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.121,500,918ක් හා අතිරික්තයේ/ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.12,722,381ක්	එම	මූල්‍ය ප්‍රකාශ නිවැරදිව පිළියෙළ කළ යුතුය.

	හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයට ඇතුළත් නොකිරීම හේතුවෙන් ශුද්ධ වත්කම රු.108,778,537 කින් අඩුවෙන් දක්වා තිබුණි.	
(ඒ)	පොදු දේපළ සඳහා වන හානි රු. 31,105 ක් හා සේවා ගාස්තු (කසළ බැහැර කිරීම) සඳහා වන රු. 632,160 ක් අයහාරය ලෙස සලකා ගිණුම්ගත කිරීම හේතුවෙන් අතිරික්තය රු. 663,265 කින් වැඩියෙන් දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන පිළියෙල අයහාරය නිවැරදිව කිරීමේදී ගිණුම්කරන අඩුපාඩු හඳුනාගත යුතුය. මගහරවා ගෙන කටයුතු කරන බව.
(ඔ)	පුස්තකාල සාමාජික ගාස්තු රු. 116,452 ක් හා පාඨමාලා ගාස්තු රු. 1,321,000 ක් ඊට අදාළ ලෙජර් ගිණුම්වලින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයහාරය ලෙස නොගැනීම හේතුවෙන් අතිරික්තය රු. 1,437,452 කින් අඩුවෙන් දක්වා තිබුණි.	එම එම

1.6.3 නොසැඳුු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සභාව සතු මුළු හිමිකම හා වගකීම් එකතුව රු. 1,433,002,307 ක් වූ අතර උපලේඛන අනුව එකතුව රු. 883,860,389 ක් වූයෙන් රු. 549,141,918 ක වෙනසක් විය.	පිළිතුරු ලබා දී නොමැත.	නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කිරීමට පියවර ගත යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 (1) වගන්තිය	කොස්ගම මහජන පොළ භූමිය තුළ බුලත් කෙළ ගැසීම මෙන්ම සනීපාරක්ෂක කටයුතු සඳහා ඒ අවට යොදා ගැනීම හේතුවෙන් අධික දූර්ගන්ධයක් පැවතුණි. එමෙන්ම, පොළ පිටුපස කැටගල් අතුරා ඇති කොටස ඉතා අපිරිසිදු	පිළිතුරු ලබා දී නොමැත.	ප්‍රාදේශීය සභා පනතට අනුකූලව කටයුතු කළ යුතුය.

		තත්වයේ පැවති අතර, එහි ඇති කාණු පද්ධතිය ආවරණය කර තිබුණු කම්බි ප්ලේට් මලකඩ කා දිරාපත් වී කැඩී තිබීම හේතුවෙන් අනතුරුදායක තත්වයක් පැවතුණි.		
(ආ)	2017 දෙසැම්බර් 21 දිනැති අංක 2017/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2(i) ඡේදය	කොට්කාවත්ත ප්‍රාදේශීය සභාවෙන් ලැබී තිබුණු කැබ් රථයක් සභාව නමින් මෙතෙක් පවරා ගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව සභාව නමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන නාගරික සංවර්ධන අධිකාරි සැලසුම් චක්‍රලේඛය	පළාත් පාලන ආයතනවල නාගරික සංවර්ධනය සඳහා පවත්වාගෙන යන බැංකු ගිණුමේ ප්‍රමාණවත් මුදලක් සමුච්චනය වූ විට නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය මත හඳුනාගත් ව්‍යාපෘතියක් සඳහා යෙදවිය හැකි වුවත්, බැංකු ගිණුමේ පවතින රු. 18,512,095 ක මුදල් එසේ සංවර්ධන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	නාගරික සංවර්ධන අධිකාරි සැලසුම් චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඇ)	2020 දෙසැම්බර් 3 දිනැති අංක 13/2016/(i) දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 5 සහ 6 ඡේද	බදු ගිවිසගන්නට යෙදෙන සෑම ගොඩනැගිල්ලකටම අදාළව ගිවිසගත් දිනෙන් සෑම වසර 03 කට වරක් ගිවිසුම් අලුත් කළ යුතු වුවද, හංවැල්ල උපකාර්යාලයේ කඩ කාමර 99 ක් අතරින් 82 ක් ද, පාදුක්ක උපකාර්යාලයේ කඩ කාමර 59 අතරින් 05 ක් ද එලෙස ගිවිසුම් යාවත්කාලීන කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	එම	චක්‍රලේඛය ප්‍රකාරව ගිවිසුම් යාවත්කාලීන කරගැනීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 164,136,809 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 14,928,217 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	ආදායම් ප්‍රභවය	2024 ඇස්තමේන්තුගත ආදායම	2024 බිල් කළ ආදායම	2024 රැස්කළ ආදායම	2024 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	2023 ඇස්තමේන්තුගත ආදායම	2023 බිල් කළ ආදායම	2023 රැස්කළ ආදායම	2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
(i)	වරිපනම් හා බදු	36,233	25,267	21,559	3,708	41,157	22,143	13,683	8,460
(ii)	කුලී	36,346	33,246	32,003	1,243	39,472	30,872	30,034	838
(iii)	බලපත්‍ර ගාස්තු	4,238	3,594	3,594	0	4,098	3,747	3,669	78
(iv)	වෙනත් ආදායම්	315,429	136,660	136,600	60	286,574	268,567	268,567	0
	එකතුව	392,246	198,767	193,756	5,011	371,301	325,329	315,953	9,376

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පෙර වර්ෂයේ රැස්කළ රු. 315,953,099 ක ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු. 193,756,033 ක් දක්වා රු. 122,197,066 කින් අඩු වී තිබුණි .	2024 වර්ෂයේ දී බිල් නොකළ ආදායම ඇතුළත් නොකොට රු. 136,660 ක් ලෙස බිල් කළ ආදායම පමණක් ඇතුළත් කොට ඇති බව.	ආදායම් බිල් කිරීම් නිසි පරිදි සිදු කොට ආදායම් එක්රැස් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු. 1,242,924 ක කුලී ආදායමෙන් හිඟ කඩ කුලී රු. 538,900 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	පාදුක්ක ධීවර මත්ස්‍ය අලෙවි සැලේ කඩකුලී අය කිරීම සම්බන්ධයෙන් ඇති වූ ගැටලුව නිරාකරණය කිරීමෙන් අනතුරුව හිඟ මුදල අය කිරීමට කටයුතු කරන බව.	හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ප්‍රචාරක දැන්වීම් පුවරු ආදායම් සඳහා 2024 වර්ෂය වෙනුවෙන් රු. 1,527,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2024 වර්ෂයේ වාර්ෂික බිල් කිරීම රු. 549,585 ක් විය. ඒ අනුව වාර්ෂික ඇස්තමේන්තු ආදායමට වඩා වාර්ෂික බිල් කිරීම රු. 977,415 කින්, එනම් සියයට 64 කින් අඩු වී තිබුණි.	දැන්වීම් පුවරුවලින් සභාවට අය කර ගැනීමට බලය ඇති ආදායම පමණක් අයකර ගැනීමට ක්‍රියා කර ඇති බව.	ප්‍රචාරක දැන්වීම් පුවරු ආදායම නිවැරදිව බිල් කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 84,606,603 ක් හා මුද්දර ගාස්තු රු. 346,615,602 ක් විය.	2023 හා 2024 වර්ෂවල මුදල් ඉදිරියේදී ලබා ගැනීමට අවශ්‍ය උපලේඛන සකස් කරමින් පවතින බව.	අවශ්‍ය උපලේඛන සකස් කර, උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පොළ භූමියෙන් ඉවත් කරන ලද නරක් වූ එළවළු කොටස් ඉවත් කිරීමට ඇති දිරන කසල රැස් කරන ස්ථානය අවට ජලය එක් රැස් වී තිබූ අතර එම ජලය පොදු වැසිකිළියේ අපද්‍රව්‍ය ටැංකිය දෙසට ගලා යාම හේතුවෙන් එම ටැංකියේ මතුපිට පෘෂ්ඨය දිරාපත් වී අනතුරුදායක තත්වයක් පැවතුණි. එමෙන්ම, පොළ භූමියේ පිහිටා ඇති වැසිකිළියට සම්බන්ධ ජල ප්‍රවාහන පද්ධතියේ කලක සිට පැවති ජල කාන්දුව හේතුවෙන් එය භාවිතයට ගැනීමට අපහසු වී තිබුණි.	ඉදිරියේදී අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව.	සති පොළේ කාණු පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 4වන ඡේදයට අනුව සභාව විසින් ප්‍රචාරක දැන්වීම්වලින් ආදායම් උපයා නොතිබූ අතර 2024 වර්ෂයේ ප්‍රචාරක දැන්වීම් සඳහා උපයා තිබුණේ රු.549,985 ක ආදායමක් පමණක් විය.සභාව විසින් පවත්වා ගෙන යන දැන්වීම් පුවරු ලේඛනය විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබූ අතර දැන්වීමක් පල කිරීමට බලපත්‍රයක් ලබා ගැනීමට පැමිණෙන ව්‍යාපාරිකයන්ගේ දැන්වීම් පමණක් එම ලේඛනයට ඇතුළත් කර තිබුණි.	සමීක්ෂණ වාර්තාව අනුව ආදායම් රැස් කිරීමට කටයුතු කරන බවත් ගෙවීම් පැහැරහරින දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට කටයුතු කරන බව .	දැන්වීම් පුවරු සමීක්ෂණයට අනුව ආදායම් රැස් කළ යුතු අතර, ගෙවීම් පැහැර හරින දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට පියවර ගත යුතුය.

(ඇ) සභාවේ දැන්වීම් පුවරු ලේඛනයට අනුව 2023වර්ෂයේ ලියාපදිංචි කර 2024 වර්ෂයේ මුදල් නොගෙවූ ස්ථිර දැන්වීම් පුවරු හා තාවකාලික දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණු අවස්ථා පැවතුණි.	මුදල් නොගෙවන දැන්විම් පුවරු ගලවා ඉවත් කිරීමට කටයුතු කරන බව.	මුදල් නොගෙවන දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ) ඉහත අතුරු ව්‍යවස්ථාවේ 21 වන ඡේදයට අනුව දැන්වීම් පුවරුවක් කෙසේ හෝ නගරයේ අලංකාරයට කුමන අයුරකින් හෝ තර්ජනයක් වන්නේ නම් එබඳු දැන්වීම් පිළිබඳ ලිඛිත දැන්වීමක් අදාළ අයිතිකරු වෙත භාරදී දින 07 ක් ඇතුළත යථා පරිදි සකස් කිරීමට කටයුතු කළ යුතු අතර එසේ නොමැති නම් සභාව විසින් එය ඉවත් කළ යුතු බව සඳහන් වුවද එසේ දූර්වර්ණ වී තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 10 ක් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	දූර්වර්ණ වූ දැන්විම් පුවරු ඉවත් කිරීමට කටයුතු කරන බව.	අදාළ අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ) සිත් ගන්නා දැකුම්කලු පරිසරයක පිහිටා ඇති කුමාරි ඇල්ල නැරඹීම සඳහා සති අන්ත දිනවල පුද්ගලයන් 3000 කට ආසන්න පිරිසක් පැමිණෙන බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම ස්ථානය සංවර්ධනය කර ප්‍රාදේශීය සභාව යටතේ සංචාරකයින් සඳහා ටිකට් නිකුත් කර ආදායම් උපයා ගැනීමට හැකියාව පැවතියද, ඒ සඳහා සභාව අවධානය යොමු කර නොතිබුණි.	අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සොයා ගැනීමට නොහැකි වීම මත මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වූ බව.	අවශ්‍ය මුදල් ප්‍රතිපාදන රැස්කර ගෙන ව්‍යාපෘතිය ආරම්භ කළ යුතුය.

3.2 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සභා පරිපාලනය යටතේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන 05 ක් පැවතියද, සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ වෛද්‍යවරු 04 ක් වූ අතර ඉන් එක් තනතුරක පුරප්පාඩු පැවතුණි. එබැවින් හංවැල්ල ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා එක් වෛද්‍යවරයකු ද ඉතිරි ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන 04 සඳහා වෛද්‍යවරුන් දෙදෙනෙකු ද අනුයුක්ත කිරීමට සිදු වීම හේතුවෙන් එම ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන 04 සතියකට දින 03 ක් පමණක් විවෘතව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. මේ හේතුවෙන් බල ප්‍රදේශයේ ජනතාවට පොදු උපයෝගී සේවා යටතේ සෞඛ්‍ය සේවා පහසුකම් ලබා ගැනීමේදී ප්‍රායෝගික ගැටලු පවතින බව නිරීක්ෂණය වූ අතර වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව වැඩි වීමට සාපේක්ෂව අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	රෝහල් සංඛ්‍යාවට සාපේක්ෂව වෛද්‍ය තනතුරු සංශෝධනය සඳහා කාර්තු වාර්තාව සමඟ ප්‍රධාන ලේකම් හා පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලීම් කර යවා ඇති බව.	අනුමත වෛද්‍ය තනතුරු සංඛ්‍යාව වැඩිකර ගැනීමට පියවර ගත යුතුය.
(ආ) අනුමත ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරු 04 ක්, පුස්තකාලාධිපති තනතුරු 04 ක්, සෞඛ්‍ය පරිපාලන තනතුරු හා රියදුරු තනතුරු 05 ක් වසර 02 ත් 05 ත් අතර කාලයක සිට පුරප්පාඩුව පැවතීම හේතුවෙන් එම තනතුරුවල රාජකාරී ඉටු කිරීම සඳහා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් හා පුස්තකාල සහායකවරුන් යොදවා තිබුණි.	මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් නොකරන ලෙස දන්වා ඇති බැවින් මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇති බව.	අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.